# සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම්හි ලාභ විසර්ජන අනුපාතයන් සංශෝධනය කිරීම

**බැංකු මුල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට හත්වන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ................................
2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, ................................
3. සභාපති,විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, ..............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,

   සමෘද්ධි මහ සංගමය, ..........................................
5. මුලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, .........................................
6. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ........................................
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
8. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.

**බැංකු මුල්‍ය කටයුතු අංශය,ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.01.01**

දුරකථන අංකය :- 0112 – 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.01.01

# සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම්හි ලාභ විසර්ජන අනුපාතයන් සංශෝධනය කිරිම

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 ට හත්වන එකතුව**

**1. හැදින්වීම.**

1.1 සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම්හි වර්ෂ අවසාන ලාභ විසර්ජනය සිදු කිරිම පිළිබදව මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 සහ ඊට කරන ලද එකතුන් මගින් අවශ්‍යතාවය පරිදි උපදෙස් ලබාදී ඇත.

1.2 ලාභ විසර්ජනය කළ යුතු අනුපාතයන් සම්බන්ධයෙන් ආරම්භයේදී ලබාදී ඇති ප්‍රතිශතයන් හැරෙන්නට සංශෝධනයන් මෙතෙක් සිදු කර නොමැත.

1.3 බැංකු පද්ධතියේ උන්නතිය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය විසින් දක්වනු ලබන සෘජු දායකත්වය සැලකිල්ලට ගෙන දැනට ඇති ලාභ විසර්ජන අනුපාතයන් තුල යම් සංශෝධනයන් සිදු කිරිම මෙම උපදෙස් තුලින් බලාපොරොත්තු වේ.

1.4 නව සංශෝධනය යටතේ ලාභ විසර්ජනය සම්බන්ධව පහත සදහන් ගිණුම් පොදු ලෙජරයේ විවෘත කළ යුතු අතර ඒ සදහා වන කේත අංක පහත පරිදිවේ.

(i) සේවක අභිප්‍රේරණ සදහා වූ අරමුදල් ගිණුම.
(ii) පරිපාලන වැය සදහා ප්‍රධාන කාර්යාලයට බැර කළ යුතු අරමුදල් ගිණුම.
(iii) සමෘද්ධි අධිකාරියෙන් ලද, බැංකු සංගමයේ වියදම් සදහා අරමුදල් ගිණුම.

**2.** මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 මගින් හදුන්වා දී ඇති දැනට අනුගමනය කරනු ලබන ලාභ විසර්ජන අනුපාතයන් පහත සදහන් පරිදිවේ.

| | | |
|---|---|---|
| i) | රදවාගත් ලාභ අලාභ ගිණුම | - 50% |
| ii) | කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුම | - 25% |
| iii) | පොදු සුභ සාධක අරමුදල් ගිණුම | - 10% |
| iv) | සේවක දිරිදීමනා ගිණුම | - 5% |
| v) | මහ සංගමයට වෙන් කළ අරමුදල් ගිණුම | - 10% |
| | | - 100% |

2.1 ඉහත 2 ඡේදය යටතේ වෙන්කරන ලද සේවක දිරි දීමනාව පහත සදහන් පරිදි බැංකු සංගම් වලදී විසර්ජනය වනු ඇත.

| | | |
|---|---|---|
| i) | කළමනාකරු | - 25% |
| ii) | සහකාර කළමනාකරු | - 20% |
| iii) | බැංකු කාර්ය මණ්ඩල (4) | - 25% |
| iv) | ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල (10-15) | - 30% |
| | | - 100% |

3. ඉහත සදහන් දිරි දීමනා විසර්ජනය සම්බන්ධව හදුනාගත් ගැටළු නිරාකරණය කරගැනීමට පහත සදහන් සංශෝධනයන් සිදුකරනු ඇත.

3.1 මෙම නව සංශෝධනය යටතේ මුලික ලාභ විසර්ජන අනුපාතයන් බෙදි යන ආකාරය පහත සදහන් පරිදිවේ.

| | | |
|---|---|---|
| i) | රදවාගත් ලාභ අලාභ ගිණුම | - 50% |
| ii) | කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුම | - 25% |
| iii) | පොදු සුභ සාධක අරමුදල් ගිණුම | - 5% |
| iv) | සේවක දිරිදීමනා ගිණුම | - 5% |
| v) | මහ සංගමයට වෙන් කළ අරමුදල් ගිණුම | - 5% |

vi) සේවක අභිප්‍රේරණය සහ සුභසාධනය සඳහා - 5%
vii) පරිපාලනය වියදම් - 5%
- 100%

අංක 6 හා 7 සඳහා වන පොදු ලෙජරයේ කේත අංක පහත පරිදි වන අතර,පොදු ලෙජරයේ මෙම ගිණුම් විවෘත කරගත යුතුය.

| <u>ගිණුමේ නම</u> | <u>කේත අංකය</u> |
|---|---|
| (වගකීම් යටතේ)<br>* සේවක අභිප්‍රේරණය සඳහා වෙන් කරන ලද අරමුදල් ගිණුම(5%) | - 4206 |
| (වගකීම් යටතේ)<br>* ප්‍රධාන කාර්යාලයේ පරිපාලන වියදම් සඳහා බැර කළ යුතු අරමුදල් ගිණුම (5%) | -4207 |

3.1.1 සේවක දිරිදීමනා බෙදියාම පෙර පැවති ප්‍රතිශතය එලෙසම නොවෙනස්ව බෙදීම කළ හැකිය.

3.2 2009 වර්ෂ අවසානයේදී සිට ලාභ විසර්ජනය සිදු කිරිම ඉහත අනුපාතයන් අනුව සිදු කළ යුතුය.දැනටමත් ඒ පිළිබඳව කටයුතු කර ඇති බැංකු සංගම් ඒ සඳහා අවශ්‍ය උපදෙස් බැංකු මූල්‍ය අංශයෙන් ලබාගත යුතුය.

3.3. පරිපාලන කටයුතු සඳහා වෙන් කරනු ලබන 5% ප්‍රතිශතය ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය කටයුතු අංශය වෙත ගිණුම් අංක 3417925 ට බැර වන පරිදි චෙක්පතකින් එවීමට සියළුම බැංකු සංගම් හා මහ සංගම් කටයුතු කළ යුතුය. එම මුදලින් කාර්ය මණ්ඩලයේ සේවක විෂයානුබද්ධ සංවර්ධන අධ්‍යාපන කටයුතු අවශ්‍ය පරිදි මුදල් ලබාදීමද සිදුකරනු ඇත.

3.4 වර්ෂ අවසාන ගිණුම් පියවීමත් සමග බැංකු සංගමය ලාභදායි තත්ත්වයක් පෙන්නුම් කරයි නම් පමණක් අදාල විගණන වාර්තාව අනුමත වූ පසුව පමණක් ඉහත අංක .3 පරිදි කටයුතු කළ යුතුය. වර්ෂයට අදාල විගණන වාර්තාව අනුමත වී නොමැති නම් අනෙකුත් ලාභ විසර්ජන සිදු කළ නොහැකි අතර මෙම ප්‍රතිශතය පමණක් ප්‍රධාන කාර්යාලය වෙත එවිය හැකිය.

**4.** සේවක දිරිදීමනා අනුපාතය පෙර පැවති 5% එලෙසම පවතින අතර අතිරේක ලද 5% ප්‍රමාණය සේවක අභිප්‍රේරණ යටතේ පහත සඳහන් පරිදි විසර්ජනය කිරිමට කටයුතු කළ යුතුය.

4.1 ඒ අනුව සේවක අභිප්‍රේරණ සඳහා වෙන් වූ 5% ප්‍රතිශතය පහත සඳහන් පරිදි කාර්ය මණ්ඩලය වෙත විසර්ජනය කිරිමට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| i) | බැංකු කාර්ය මණ්ඩලයේ පුහුණුවීම් සඳහා | 20% |
| ii) | කලාප සහකාර සඳහා (ක්ෂේත්‍ර සහකාර) | 15% |
| iii) | කාර්ය මණ්ඩලයේ සුභ සාධනයට | 10% |
| iv) | බැංකු කාර්ය මණ්ඩලය (හතර දෙනා සඳහා) | 5% |
| v) | ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට | 50% |

4.2 නිලධාරින් සඳහා අළුතින් ලද 5% ප්‍රතිශතය විසර්ජනය කිරිමේදී ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා වන 50% ප්‍රතිශතය ලබාදිමේදී පහත සඳහන් නිර්නායක කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

i නිලධාරියාගේ වසමේ බොල් ණය ප්‍රතිශතය සලකා බැලීම.

ii වර්ෂය තුල ලබාදී ඇති ණය හා පිටහිටි ණය සලකා බැලීම

iii අදාල වසම තුල ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දක්වනු ලබන දායකත්වය.

iv ප්‍රධාන කාර්යාලය මගින් හඳුන්වා දෙනු ලබන ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් තුලින් බැංකු සංගමය ගෙන යනු ලබන තැන්පතු රාශිකරණය

* මෙම ඉහත කොන්දේසි සපුරාලිය නොහැකි විට එම නිලධාරියාට හිමි අභිප්‍රේරණ ප්‍රතිශතය අදාල අනෙක් අය අතර බෙදී යන අයුරින් කටයුතු කළ යුතුය.

**5.** අංක 2.3 ඡේදය පරිදි ප්‍රධාන කාර්යාලය වෙත ලබාගන්නා පරිපාලන වියදම් 5% තුලින් පහත සඳහන් පරිදි කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂිතය.

i රාජකාරි කටයුතු සඳහා බැංකු/ මහ සංගම් හෝ වෙනත් ස්ථානයකට යන නිලධාරින් සඳහා වන දීමනා ලබාදීම, ඉන්ධන වියදම් සහ වෙනත් පරිපාලනවියදම් ලබාදීම.

ii අනෙකුත් කාර්ය මණ්ඩලය විෂයානු බද්ධ පුහුණුව, උසස් අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය මතමෙම මුදල් වැය කරනු ඇත.

**6.** ඉහත ලාභ විසර්ජන අනුපාත සංශෝධනයන්ට අමතරව ලාභ විසර්ජන සිදු කිරිම පිළිබද පහත සඳහන් උපදෙස් ලබාදෙනු ඇත.

6.1 බැංකු සංගමයකට හෝ මහ සංගමයක යම් නිලධාරිනියක වරප්‍රසාද යටතේ හිමි දින 84 කාලසීමාව තුල ලබාගත් ප්‍රසූත නිවාඩු කාලය සඳහා වන ලාභය ඇයට ලබාදිය යුතුය.

6.2 ඉන් පරිබාහිරව අඩ වැටුප්/ වැටුප් රහිත නිවාඩු නිලධාරිනිය ලබාගෙන තිබේ නම් එම කාල සීමාවට අදාල ලාභය වැඩ බලන ලද නිලධාරියා ගෙවිය යුතුය.

6.3 එමෙන්ම ඉහත අංක 5.1 යටතේ වරප්‍රසාද ප්‍රසූත නිවාඩු දින 84 තුල යම් නිලධාරිනියක පසුවන විට එම කාලය තුල වැඩ බලන නිලධාරියකුට ද යම් ලාභ ප්‍රතිශතයක් ලබාදීම සුදුසු බවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබි ඇත.

6.4 ඒ අනුව එම දින 84 සඳහා වැඩ බලන නිලධාරියාට ප්‍රසූත නිවාඩු ලබාගන්නා ලද නිලධාරියාගේ ප්‍රතිශතයෙන් 5% ක් ලබාදීමට කටයුතු කළ යුතුය. වැඩ බලන නිලධාරියා අදාල තනතුරේ වැඩ බැලීමට ලිඛිතව අනුයුක්ත කිරිමක් සිදු කර ඇති විට පමණක් මෙම 5% ප්‍රතිශතය ලබාදීමට කටයුතු කළ යුතුය.

7. සේවක ලාභ විසර්ජන අනුපාත සම්බන්ධව මීට පෙර ලබාදි ඇති මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 හා ඊට කරන ලද එකතුන් හි සඳහන් උපදෙස් නොවෙනස්ව පවතිනු ඇත.

8. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ඉදිරියේ දී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපිත වන බැවින් ඊට පෙර අවසන් කළ යුතුව අත්‍යවශ්‍ය වැඩ කොටස් නිම කර ඒ සඳහා සූදානම් වීමට දැරිය යුතු වියදම් පියවා ගැනීම සඳහා රු. 25,000/- මුදලක් මහ සංගම් වෙත හා රු. 10,000/- ක මුදලක් බැංකු සංගම් වෙත ලබාදීමට කටයුතු කරන අතර, එම රාජකාරි සඳහා අවශ්‍ය අනුමැතිය දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හා සහකාර සමෘද්ධි කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබාගැනීමට මේ මගින් බලය ලබාදෙනු ඇත.

<u>බැංකු සංගමයේ වියදම් සඳහා (වගකීම් යටතේ)</u>

සමෘද්ධි අධිකාරියෙන් ලද අරමුදල් ගිණුම - කේත අංක 4042

<u>මහ සංගමය සඳහා (වගකීම් යටතේ)</u>

සමෘද්ධි අධිකාරියෙන් ලද අරමුදල් ගිණුම

| | |
|---|---|
| ආර්.පී.බී. තිලකසිරි, | කේ.කේ.එල්. චන්ද්‍රතිලක, |
| අධ්‍යක්ෂ ජනරාල්. | නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්. |